ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

# 73 වන ඉන්දීය නිදහස් දිනය ශ්‍රී ලංකාවේදී සැමරේ

# කාශ්මීර නිම්නයේ සංගීතයෙන් කොළඹ ප්‍රේක්ෂකාගාරය අමන්දානන්දයට

73 වන ඉන්දීය නිදහස් දිනය සැමරීම සඳහා ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් අගෝස්තු 15 වන දින “Strings of Harmony” නමැති සන්තූර් වාදන ප්‍රසංගයක් කොළඹ, BMICH හිදී සංවිධානය කර තිබිණ. ප්‍රවීණ සන්තූර් වාද්‍ය ශිල්පීන් වන පණ්ඩිත් ශිව් කුමාර් ශර්මා සහ පණ්ඩිත් රාහුල් ශර්මා සහභාගි වූ මෙම ප්‍රසංගය පැමිණ සිටි සංගීත ලෝලීන් අමන්දානන්දයට පත් කළේය.

සිය නිර්මාණාත්මක කුසලතාවයෙන් ප්‍රේක්ෂකාගාරය දැහැන් ගත කළ පණ්ඩිත් ශිව් කුමාර් ශර්මාගේ සහ ඔහු පුත් රාහුල් ශර්මාගේ මෙම ප්‍රසංගය සඳහා අමුත්තන් 1500කට වැඩි පිරිසක් සහභාගී වූහ . කාශ්මීරයේ සංගීත පවුලකින් පැවැත ගෙන මෙම ප්‍රවීණ සංගීත ශිල්පීන් දෙපළට අමතරව බර්කා ශර්මා, භවානි ප්‍රසාද් කතක්, යෝගේෂ් රත්නකාර් සම්සි සහ ටකහිරෝ අරායි යන දක්ෂ වාදන ශිල්පීන්ද තන්පුරා, තබ්ලා සහ පඛවාජ් වාදනයෙන් මෙම ප් රසංගයට සහභාගී විය.

කාශ්මීර නිම්නයේ උපත ලද තත් සියයකින් සමන්විත සුවිශේෂී ජන සංගීත භාණ්ඩයක් වන සන්තූර් සඳහා සම්ප්‍රදායික සංගීතය තුළ ඉඩක් විවර

කර දුන්නේ පණ්ඩිත් ශිව කුමාර් ශර්මා විසිනි . අඩ සියවසකටත් වැඩි සිය සංගීතමය අත්දැකීම් ඔස්සේ ඔප් නංවා ගත් නිර්මාණාත්මක කුසලතාවයන් සමගින් ඔහු නවමු වාද්‍යමය සංගීත කලාවක් නිර්මාණය කර තිබේ . ඔහු ඉන්දියානු රජය විසින් සිවිල් වැසියෙකුට පිරිනමන දෙවන ඉහළම සම්මානය වන පද්ම විභූෂණ සම්මානය ඇතුළු ජාතික සහ ජාත්‍යන්තර සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. සාම්ප්‍රදායික සංගීත නිර්මාණයන්ට අමතරව සිසිලා, චාන්ද්නි, ලම්හේ හා ඩාර් ආදී ආදායම් වාර්තා පිහිටවූ බොලිවුඩ් චිත්‍රපට සඳහා ඔහු කළ සංගීත නිර්මාණ ලොව පුරා අද ද ජනාදරයට පත් ව තිබේ.

ශ්‍රී ලංකාවෙ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමාගේ ප් රධානත්වයෙන් පැවති මෙම සංස්කෘතික සැදෑවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙ කථානායක කරු ජයසූරිය මැතිතුමා සහභාගි විය. අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා , අමාත්‍ය ගරු පලනි දිගම්බරම් මැතිතුමා, අමාත්‍ය ගරු දයා ගමගේ මැතිතුමා , නියෝජ්‍ය අමාත්‍ය ගරු අනෝමා ගමගේ මැතිනිය, රාජ්‍ය අමාත්‍ය ගරු වී . රාධාක්‍රිෂ්ණා, ආණ්ඩුකාර ගරු සුරේන් රාඝවන් සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

“Weaves and Stitches of India: the Saree Sutra” නමින් ඉන්දියාවේ විවිධ ප්‍රාන්තයන්හි රෙදිපිළි සහ ගෙතුම් හි විවිධත්වයේ ඒකමුතුබව දැක්වෙන දැක්වෙන ප්‍රදර්ශනයක්ද BMICH හිදි පැවති අතර එය ප්‍රේක්ෂකයන්ගේ නොමද ප්‍රශංසාවට ලක් විය.

ඉන්දියාවේ 73 වන නිදහස් දින සැමරුම් ඉන්දීය මහ කොමසාරිස්තුමාගේ නිල නිවස වන කොළඹ, ඉන්දියා හවුස් හි ඉන්දීය ධජය එසවීමේ උත්සවයකින් ආරම්භ විය . මහජනයාට විවෘත වූ මෙම උත්සවය සඳහා ඉන්දියානු ජාතිකයන් රැසක් එක්ව සිටියහ.

මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ජාතිය අමතා සිදු කළ කතාව උත්සව සභාවට ඉදිරිපත්

කළේය. එහිදී සියලු ආකාරයේ ත්‍රස්තවාදයන්ට එරෙහිව ඉන්දියාව ශ්‍රී ලංකාව සමග සිටින බව එතුමා අවධාරණය කළේය. මහ කොමසාරිස්තුමාගේ දේශනයෙන් අනතුරුව ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල ජන සහ සාම්ප්‍රදායික නර්තනාංග රැගත් කෙටි සංස්කෘතික වැඩසටහනක්ද පැවැත්විණ.

කොළඹ

2019 අගෝස්තු 16